# මහනුවර ගොවි හමුව

ගොවිකටයුතු කිරීමේදී ගොවි ජනතාවට මුහුණ දීමට සිදු වන ගැටළු අවබෝධ කර ගැනීම සඳහාත් ඒවාට ගොවි මහතුන්ම ඉදිරිපත් කරන විසඳුම් දැන ගැනීම සඳහාත් ඒ ඒ දිස්ත්‍රික්කවල ගොවි මහතුන් එකට මුණ ගස්වා සුහද අදහස් හුවමාරුවක් පිළියෙල කිරීමට ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කටයුතු කළා. මේ කාර්යයෙහිදී ගොවිකම් දෙපාර්තමේන්තුවේත්, ග්‍රාමීය ආයතන හා පලද වර්ධන නීති අංශයේත් නොමසුරු සහ යෝගය ආයතනයට ලැබුණා. මේ විදියට පිළියෙල කල සම්මේලන මාලාවේ පළමුවන ගොවි හමුව කොළඹ, අනුරාධපුර, මන්නාරම වවුනියාව සහ යාපනය යන දිස්ත්‍රික්ක වලින් තෝරා ගත් ගොවි මහතුන් සම්බන්ධ කරවාගෙන යාපනයේදී පැවැත්වුනා. එහිදී ගොවි මහත්වරු 'ගොවි තැන් කටයුතුවලදී වැඩිම නිෂ්පාදනයක් ලබා ගැනීමට ඇති බාධා' කියන මාතෘකාව යටතේ තම තමන්ගේ ගැටළු දක්ෂ ලෙස ඉදිරිපත් කර ඒවාට විසඳුම් සෙවීමටද උත්සාහයක් දැරුවා. මේ විදියේ දෙවන සමුළුව කොළඹ, ගාල්ල, කළුතර, මාතර සහ රත්නපුර යන දිස්ත්‍රික්ක වලින් තෝරා ගත් ගොවි මහතුන්ගේ සහභාගිත්වයෙන් ගාල්ලේදී පැවැත්වුවා. තුන්වැන්න පැවැත්වූයේ මඩකලපුවේදියි. ඒ සමුළුවට අම්පාර, ත්‍රිකුණාමලය, මොණරාගල, හම්බන්තොට සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලින් තෝරා ගත් ගොවි මහතුන් සහභාගි වුනා.

මෙම සම්මන්ත්‍රණ මාලාවේ සිව්වැනි වුත්, අවසාන වුත් සමුළුව පසුගියද මහනුවර, සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පැවැත්වුනා. සමුළුවට සහභාගී වූ මාතලේ, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වලින් තෝරා ගත් ගොවි මහතුන් 'වර්තමාන කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන සහ සුළු ගොවියා' යන මාතෘකාව යටතේ සිය අදහස් හුවමාරු කරගෙන ගොවිතැන් කටයුතු දියුණුවට වටිනා අදහස් ඉදිරිපත් කළා. මේ සමුළුවට සහභාගී වී සිය අදහස් දැක්වූ කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා පැවසුවේ ගොවිජනතාව වෙත නිසි තැනක් දී ඔවුන්ගේ උත්සාහයන් සඳහා රජයෙන් සෑම සහනයක්ම සලසා ඇත්තේ ආර්ථික නිදහස ලබා ගැනීමට බවයි. ඉඩම් නැති ගොවි ජනතාව අතර ඉඩම් බෙදා දී රට ආහාර වලින් ස්වයංපෝෂිත කිරීමේ කාර්යය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණය වැනි වැදගත් නීති රීති සම්මත කළ බවත් වර්තමාන ආර්ථිකයේ ගොවි ජනතාව වෙත උසස් ස්ථානයක් හිමි කර දීම සඳහා රජය සෑහෙන වැඩ කොටසක් ඉටු කර ඇති බවත් එතුමා ප්‍රකාශ කළා.

ගොවි සමුළුව පැවැත්වුන පළමු දවසෙහි ඒ ඒ දිස්ත්‍රික්කවල කටයුතු කරන දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි මහතුන් විසින් දිස්ත්‍රික්කය පිළිබඳව හැඳින්වීමක් කළායින් පසුව, ගොවි මහතුන් තම පෙදෙස්වල ගොවිතැන් කටයුතු කරගෙන යාමේදී මුහුණ දීමට සිදු වන නොයෙකුත් දුෂ්කරතාවයන් ගැන දක්ෂ අයුරින් අදහස් ප්‍රකාශ කළා. පළමු කොටම මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිතැන් කටයුතු කිරීමේදී ඇති නොයෙකුත් ගැටළු ගැන අදහස් ඉස්මතු වුනා.

### මහනුවර දිස්ත්‍රික්කය

- මහවැලි ගඟ හැරවීම නිසා මිනිපේ ව්‍යාපාරයේ 111 වන අදියරේ පෙදෙස්වලට ජලය නොලැබීමෙන් කුඹුරු ගොවිතැන් කරගෙන යාමට මෑතදී සිදු වී ඇති දුෂ්කරතාවය.
- ගොයම් කපා අස්වැන්න රැස් කරන කාලයේදී වී ගබඩා කිරීමට විවිධ සේවා සමුපකාර සමිතිවලට ගබඩා පහසුකම් නොමැති හෙයින් එම සමිති විසින් ගොවීන්ගේ වී ප්‍රතික්ෂේප කිරීම.

හා ඇතැම්විට ගොවීන් දුන් වීවලට කලට වේලාවට මුදල් නොලැබීම.

❁ බුසල් ප්‍රමාණය අනුව නොව වී කිරා මැන මිළයට ගැනීම සම්බන්ධයෙන් ගොවීන් දක්වන අකමැත්ත.

❁ ගොවිතැන් කටයුතු සඳහා උවමනා කරන පරිදි ට්‍රැක්ටර් ලබා ගැනීමට දිස්ත්‍රික්කයේ ඇති අපහසුකම.

❁ කිරි පට්ටි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ලැබෙන ණය සුළු ගොවීන් හට නොලැබීම හා පුන්නක්කු, කුකුල් කෑම ආදියෙහි මිළ ගණන් අධික ලෙස ඉහළ ගොස් තිබීම.

❁ සතුන් හට ලෙඩ රෝග ඇති වූ අවස්ථාවකදී පශු වෛද්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා ඉතාමත් අධික මුදලක් වැය කිරීමට ගොවීන් හට සිදු වීම.

❁ විවිධ සේවා සමුපකාර සමිති වලින් ගොවීන්ගෙන් ඇතැම්විට කිරි ලබාගෙන එම කිරි ඔවුනට ආපසු හෝ නොදී ඒවා ප්‍රතික්ෂේප කරන බව ගොවි මහත්වරු බොහෝ දෙනෙක් ඉදිරිපත් කළ ප්‍රශ්නයක් විය. මෙහිදී ගොවීන් සැක කරනුයේ සමුපකාර සමිතිවල ඇතැම් අක්‍රමිකතාවයන් පවතින බවය.

❁ දිස්ත්‍රික්කයේ කඳු මුදුන් හෙළි පෙහෙලි කර නොයෙකුත් බෝග වගා කිරීම නිසා ස්වාභාවික දිය උල්පත් සිඳී යාමෙන් උග්‍ර ජල හිඟයකට මුහුණ දීමේ අවදානම පැවතීම.

## මාතලේ දිස්ත්‍රික්කය

❁ මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණ දෙන බරපතල ගැටළුවක් ලෙස සඳහන් කළේ සී සෑම් කටයුතු සඳහා අවශ්‍ය කරන මී හරකුන් ලබා ගත නොහැකි බවයි. මෙම ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් පලද වර්ධන කම්ටුවලට පවරා ගත් ඉඩම් අක්කර 10 බැගින් දී තෘණ බිම් ඇති කළයුතු බව ගොවි මහතුන් සඳහන් කළා.

❁ දිස්ත්‍රික්කයේ සංවර්ධන සැළසුම් සකස් කිරීමේදී ඒවාට සහාය වන කෘෂිකර්ම උපදේශකවරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් නිතර නිතර ස්ථාන මාරු කිරීමද ගොවි මහතුන්ට හා පලද වර්ධන කම්ටුවලට මුහුණ දීමට සිදු වන තවත් ගැටළුවකි.

❁ මාතලේ දිස්ත්‍රික්කයේ පුළුල් වශයෙන් කෙරෙන එළවළු වගාවෙහිදී ඕනෑ කරන රසායනික පෝර ආදියෙහි තත්ත්වය ඉතා මත් බාල වී ඇති බවත් එම පෝර වලින් කිසිසේත් ප්‍රතිඵල නොලැබෙන බවත් ගොවි මහතුන් සඳහන් කළා. කවර රසායනික පෝර වර්ගයක් කවර ප්‍රමාණයකින් දැමිය යුතුද යන්න ගැන සෑහෙන අවබෝධයක් ගොවි මහතුන්ට නොමැතිකමත් මාතලේ දිස්ත්‍රික්කයේ පිටිසරබද ගොවි මහතුන් මුහුණ දෙන ගැටළුවක්. මෙම ප්‍රශ්නය සඳහා ව්‍යාප්ති සේවය කාර්යක්ෂම කළයුතු බව ගොවි මහතුන්ගේ අදහස වුනා.

❁ මාතලේ වැනි දුර බැහැර දිස්ත්‍රික්කයක තවත් ගැටළුවක් වනුයේ එළවළු කලට වේලාවට විකුණා ගැනීමට නොහැකි වීමයි. බොහෝවිට එළවළු කුණුවී අපතේ යන බව ගොවීන් සඳහන් කළා.

## කෑගල්ල දිස්ත්‍රික්කය

❁ කෑගල්ල දිස්ත්‍රික්කයේ පවතින බරපතල ප්‍රශ්නයක් ලෙස ගොවි මහතුන් සඳහන් කළේ ඉඩම් හිඟයයි. මීට පිළියමක් වශයෙන් සමූහ නිෂ්පාදන ක්‍රම වැනි වගා පිළිවෙත් අනුගමනය කළයුතු බව ගොවීන්ගේ අදහස වුනා.

❁ ගොවිකාරක සභාවලට සිය කටයුතු ඉටු කරගැනීම සඳහා මධ්‍යස්ථාන නොමැතිකමත් ගොවි ජනතාව මුහුණ දෙන අවහිරයක්.

❁ විමධ්‍යගත අය වැය යටතේ සුළු මුදලක් හෝ වෙන් කර දෙන්නේ නම් ඉතිරි කොටස පලද වර්ධන කමිටු වලින් යොදවා මෙම මධ්‍යස්ථාන ඉදි කිරීමට පිළිවන.

❁ දිස්ත්‍රික්කය තුළ පුළුල් අයුරින් කෙසෙල් වගාව සහ කහ වගාව කරගෙන ගියත් අඩුපාඩුවක්ව පවතිනුයේ මෙවැනි වගා වන් සඳහා පිළිගත් ණය ක්‍රමයක් නොමැතිකමයි.

❁ කෙසෙල් හා කහ වැනි වැඩි නිෂ්පාදන-යක් ඇති ද්‍රව්‍ය අනිකුත් දිස්ත්‍රික්කවලට යවා එම දිස්ත්‍රික්කවල අතිරික්ත ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ යෝජනා ක්‍රමය කින් මහගු ප්‍රතිඵල ලබාගත හැකි බව මෙහිදී පැහැදිලි වුනා.

## කුරුණෑගල දිස්ත්‍රික්කය

❁ විශාල වශයෙන් වී ගොවිතැන කෙරෙන ප්‍රදේශයක් හැටියට කුරුණෑගල දිස්-ත්‍රික්කයේ ගොවීහු ලොකු බාධාවක් ලෙස සඳහන් කළේ හොඳ තත්ත්වයේ ඉසින යන්ත්‍ර යනාදිය ලබා ගැනීමට ඇති අපහසුවයි.

❁ කුඹුරු ගොවිතැන් කටයුතු ගොවීන් සියළු දෙනාම විසින් එක්වරම ආරම්භ කරන නිසා එවැනි කාලවලදී ට්‍රැක්ටර් ලබා ගත නොහැකි වීමත්, පෞද්ගලික ට්‍රැක්ටර් කුලියට ගැනීම සඳහා අධික මුදලක් දැරීමට සිදු වීමත් දිස්ත්‍රික්කයේ ගොවීන් හට මුහුණ දීමට සිදුව ඇති ලොකුම ගැටළුවක්.

❁ ඉඩම් ප්‍රතිසංස්කරණය යටතේ කුරුණෑ ගල දිස්ත්‍රික්කයෙහි පිහිටුවා ඇති ජනා-වාසවල සාමාජිකයින්ගේ අනාගතය ගැන ඔවුන් පළ කරන බියද මෙම සමුළුවේදී ඉස්මතු වුනා. එම ඉඩම්වල අයිතිය තවම සාමාජිකයින් වෙත පවරා නැති නිසා සුළු දෛනික දීමනාවක් ලබමින් ඒවායේ කටයුතු කරන සාමා ජික සාමාජිකාවන් බියෙන් හා සැක යෙන් පසු වන බව ගොවි මහතුන් සඳහන් කළා.

❁ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ වැඩ කටයුතු කාර්යක්ෂම අයුරින් කර ගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය නොමැතිකමත් මේ දිස්ත්‍රික්කයේ ගොවීන් ඉදිරිපත් කළ ප්‍රශ්නයක්.

## නුවරඑළිය දිස්ත්‍රික්කය

❁ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැඩි වශයෙන් කෙරෙන විදේශීය එළවළු වගාවෙහිදී ගොවීන් හට මුහුණ දීමට සිදුව ඇති ගැටළුවක් වනුයේ මෙම වගාව සඳහා අවශ්‍ය බීජ, පොර, කෘමිනාශක හා දිලීර නාශක ආදිය කලට වේලාවට ලබා ගත නොහැකි වීමයි.

❁ මේ දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණ දෙන වැදගත්ම ප්‍රශ්නයක් වන්නේ විදේශීය එළවළු වගාව සඳහා අවශ්‍ය බීජවලට විශාල මුදලක් වැය කිරීමට සිදු වීමයි. මෙම බීජ පිටරටින් ගෙන්වන නිසා ඒවා විවිහිස යෝජනා ක්‍රමයට අයත් වනවා. ගොවීන් අවධාරනයෙන්ම ඉල්ලා සිටියේ එළවළු බීජ විශේෂයෙන්, බීජ අර්තාපල් විවිහිස යෝජනා ක්‍රමයෙන් ඉවත් කළයුතු බවයි.

❁ දිස්ත්‍රික්කයේ ගොවි මහතුන් ඉදිරිපත් කළ යෝජනාවක් වුනේ කෘෂි රක්ෂණය එළවළු වගාව සඳහාද අදාළ කළයුතු බවයි.

❁ නුවරඑළියේ ඇති පතන් බිම් තණ බිම් බවට පෙරලා කිරිපට්ටි ඇති කිරීමට වැඩ කටයුතු සංවිධානය කළහැකි බව ගොවීන් අදහස් කළා.

❁ සතුන් ඇති කිරීමේදී පශු වෛද්‍ය සේවාව ගොවීන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ප්‍රමාණවත් තරම් කාර්ය-ක්ෂම නොවන බව මෙහිදී පැහැදිලි වුනා.

❁ නුවරඑළිය දිස්ත්‍රික්කයේ සූදුරු, මහදුරු, කොත්තමල්ලි වැනි කුළු බඩු වැවීමට උත්සාහයක් දරා තිබෙනවා. එහෙත් ගොවීන් හට ප්‍රශ්නයක්ව ඇත්තේ

මේවා අලෙවි කර ගැනීමට හොඳ පහසුකම් නැතිකමයි.

## බදුල්ල දිස්ත්‍රික්කය

❀ බදුල්ල දිස්ත්‍රික්කයෙහි ඉතාමත් සීඝ්‍රයෙන් දියුණු වීගෙන යන වගාවක් වනුයේ උක් වගාවයි. දැන් ප්‍රදේශයේ අක්කර 4,000 ක පමණ උක් වගා කර තියෙනවා. උක් වගා කරන ගොවීන්ට සිදුව ඇති ප්‍රධානතම බාධාවක් වනුයේ මෙම වගාව සඳහා ලැබෙන ණය මුදල ප්‍රමාණවත් නොවීමයි.

❀ උක් ඇඹරීමේ යන්ත්‍ර ලබා ගැනීමට ඇති අපහසුවද ගොවීන් මුහුණ දෙන තවත් ගැටළුවක්.

❀ කිරිපට්ටි ව්‍යාපාරය බදුල්ල දිස්ත්‍රික්කයෙහි සෑහෙන දියුණුවක් ලබා තියෙනවා. විවිධ සේවා සමුපකාර සමිති විසින් කිරි මිළයට ගැනීමේදී සිදු කරනු ලැබේ යයි සඳහන් නොයෙක් අක්‍රමිකතාවය නට ගොවීන් ගොදුරු වන බවත් මෙහිදී හෙළිදරව් වුනා.

❀ අර්තාපල් වගාව සඳහා සාධාරණ මිළ කට බීජ අල ලබා ගැනීමට නොහැකි වීමද ගැටළුවක්.

❀ මෙම දිස්ත්‍රික්කයේ වගා කටයුතු සඳහා උවමනා කරන මී හරක් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැතිකම ගොවීන් හට මහත් හිරිහැරයක්.

❀ අර්තාපල් වැවීම සඳහා මූලික වශයෙන් විශාල මුදලක් යෙදවිය යුතු හෙයින් අර්තාපල් වගාව කෘෂිරක්ෂණයට යටත් කළයුතු බව ගොවි මහතුන් කියා සිටියා.

### සමුළුවෙන් මතුවුනු වැදගත් යෝජනා

කඳුකරයේ කඳු මුදුන්වල වන පෙත් හෙළි කිරීම හේතුකොටගෙන ස්වභාවික දිය උල්පත් සිඳී යාම නිසා නුදුරු අනාගතයේදී ඉතාමත් උග්‍ර නියඟයකට ගොවීන් හට මුහුණ දීමට සිදු වන බව මෙම ගොවි හමුවේදී ගොවීන් වැඩි දෙනෙක් ප්‍රකාශ කළහ. වැඩි ලාභයක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් අවුරුදු ගණනාවක් තිස්සේ එකම වගාවක් වශයෙන් ඉඩම්වල දුම්කොළ වැවීමෙන් පස නිසරු වී යාමද ඇතැම් දිස්ත්‍රික්කවල උග්‍ර ගැටළුවකි. මෙම ගැටළු සඳහා සමුළුවට සහභාගි වූ ගොවි මහතුන් විසින්ම ඇතැම් යෝජනා ඉදිරිපත් කරන ලදී. වන පෙත් ඉවක් බවක් නැතිව හෙළි කිරීම නිසා සිදු වන හානිය වළක්වා ගැනීම සඳහා ඉතාමත් ඉක්මණින් වාරිමාර්ග පනත යටතේ වන පෙත් ආරක්ෂා කිරීමට නීතිමය පියවර ගත යුතු බව ගොවීන් වැඩි දෙනෙකුගේ මතය විය. දුම්කොළ වලින් ලබා ගන්නා ආදය මීන් සියයට කොටසක් වෙන් කර පස ආරක්ෂා කිරීමේ කටයුතුවල යෙදවීමත් දුම්කොළ සමග වෙනත් වගාවන් මාරුවෙන් මාරුවට වැවීමෙන් පසෙහි නිසරු බව ආරක්ෂා කර ගැනීමට ක්ෂණික පියවර ගැනීමත් අත්‍යවශ්‍ය බව ඔවුන් වැඩි දෙනෙක් අදහස් කළා.

විදේශ විනිමය වැය වන ට්‍රැක්ටර් මෙරටට ගෙන්වනු වෙනුවට ගොවි ජනතාවට පහසු වෙන් ලබා ගත හැකි ගව සම්පත දියුණු කිරීම උදෙසා රජයෙන් ණය මුදලක් ලබා දීම, තෘණ බිම් ඇති කිරීම ආදී ක්‍රියා මාර්ග යක් තුළින් ක්ෂණිකව පියවර වහාම ගත් යුතු යයි ගොවි මහතුන් යෝජනා කළා. ගොවීන් හට ලැබෙන පෝර, කෘමිනාශක, දිලීර නාශක ආදී කෘෂි රසායනික ද්‍රව්‍යවල තත්ත්වය බාල යයි සඳහන් කළ ගොවි මහතුන් කියා සිටියේ ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය විසින් මෙම පෝර වර්ග පරීක්ෂා කර ඒවාට නිසි පරිදි මුද්‍රා තබා නියම ගුණයෙන් යුතු කෘෂි රසායනික ද්‍රව්‍ය ගොවීන් හට ලැබෙන්නට වැඩ පිළිවෙලක් සකස් කළයුතු බවයි.

සමුළුවේදී මතු වූ මෙවැනි වැදගත් යෝජනා මෙන්ම ගොවි මහතුන් ඉදිරිපත් කළ ගැටළුද සුදුසු කටයුතු සඳහා ඒ ඒ දෙපාර්තමේන්තු හා ආයතන වෙත යොමු කරන ලදී.